# ප්‍රසම්පාදන දැන්වීමයි

**කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, වනිතා කටයුතු සහ පළාත් සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, උතුරු මැද පළාත් සභාව.**

## ගොවි භාරකාර අරමුදලේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන " නිදැලි කුකුළු පාලන වැඩසටහන" සඳහා සුදුසු කිකිළි පැටවුන් මිලට ගැනීම

උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් නිදැලි කුකුළු පාලනය සඳහා සුදුසු කිකිළි පැටවුන් මිලට ගැනීමට සුදුසුකම් ලත් යෝග්‍ය සැපයුම්කරුවන් / නිෂ්පාදකයින් වෙතින් ලංසු අයදුම්පත් කැඳවනු ලැබේ.

01. නිදැලි කුකුළු පාලනය සඳහා සුදුසු කිකිළි පැටවුන් විසිදහසක් (20000) සැපයිය යුතු අතර 2011 වසරේ අගෝස්තු 04 දිනෙන් සැපයීම ආරම්භ කර 2011 ඔක්තෝම්බර් 20 දිනෙන් අදාල කිකිළි පැටවුන් සැපයිම සම්පූර්ණ කළ යුතුය. (ප්‍රසම්පාදනයට අදාල සියලු කොන්දේසි හා පිරිවිතර අයදුම්පත්‍රය සමඟ ඇති ඇමුණුම (1) හි සඳහන් වේ.)

02. 2011.07.12 දින සිට 2011.07.26 දින දක්වා පෙ. ව 8.30 සිට ප. ව 3.00 තෙක් රු. 1000/- ක ආපසු නොගෙවන තැන්පතුවක් පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ මුදල් සහකාර වෙත ගෙවා ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කර ලංසු අයදුම්පත් හා අදාල ලියවිලි ලබාගත හැක. එමෙන්ම අපගේ නිල වෙබ් අඩවිය වන " www.ncp.gov.lk " වෙත පිවිස එහි ඇතුලත් අයදුම්පත බාගත කරගන්නේ නම් ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය, උතුරු මැද පළාත නමින් ලියන ලද රු. 1000/- ක මුදල් ඇණවුමක් අයදුම්පත සමඟ ඉදිරිපත් කළයුතු වන අතර එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත් 2011.07.27 දින ප. ව 3.30 ට පෙර ලැබෙන සේ "ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය, උතුරු මැද පළාත" නමින් ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ මෙම අමාත්‍යාංශ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලිය හැක.

04. මේ පිළිබඳව වැඩි විස්තර දුරකථන අංක 025-2226831 මගින් මෙම අමාත්‍යාංශයේ සහකාර ලේකම් (සැලසුම්) අමතා ලබාගත හැකිය.

ආර්. කේ. ප්‍රේමසිරි,
ලේකම් / ප්‍රසම්පාදන කමිටුවේ සභාපති,
කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය,
වනිතා කටයුතු සහ පළාත් සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
උතුරු මැද පළාත් සභාව.
2011.07.12

# கேள்வி அறிவித்தல்

விவசாய, விவசாய உற்பத்தி விற்பனை, கால் நடை உற்பத்தி சுகாதாரம், மகளிர் விவகாரம் மற்றும் மாகாண நடவடிக்கைகள் அமைச்சு, வட மத்திய மாகாணம்.

## விவசாயம் பொறுப்பான நிதியம் மூலம் நடைமுறைப்படுத்தும் " திறந்த கோழி வளர்ப்பு திட்ட நிகழ்ச்சி" அதற்காக தகுந்த கோழிக் குஞ்சுகள் கொள்வனவு

வட மத்திய மாகாண விவசாய அமைச்சினால் டென்டர் சபைத் தலைவரால் திறந்த கோழி வளர்ப்பு திட்டத்திற்காக தகுந்த கோழிக் குஞ்சிக் கொள்வனவு செய்வதற்கு தகுந்த வினியோகத்தர்கள்/ தயாரிப்பாளர்களினூடாக ஆரம்ப விலை விண்ணப்பங்கள் கோரப்படுகிறது.

01. திறந்த கோழி வளப்புத் திட்டத்திட்காக தகந்த கோழிக் குஞ்சுகள் இருபதாயிரம் (20,000) கொடுக்கப்பட வேண்டியதுடன், 2011 வருடம் ஆகஸ்ட் மாதம் 04ம் திகதிக்கு ஆரம்பித்து 2011 ***ஒக்தேம்பர்*** மாதம் 20ம் திகதிக்கு குறித்த கோழி குஞ்சுகள் கொடுப்பதற்கு பூரணப்படுத்தல் வேண்டும். ( டென்டருக்குரிய எல்லா விதிகளும் விபரங்கள் குறித்த தகவல் விண்ணப்பத்துடன் ஒன்றிணைத்துள்ள (1)தில் குறிக்கப்பட்டுள்ளது.)

02. 2011.07.12 தினத்தில் இருந்து 2011.07.26 தினம் வரை மு.ப. 8.30 லிருந்து பி.ப. 3.00 வரை ரூ.1000/- மீள் கொடுக்கப்படாத வைப்புப்பணம் மாகாண விவசாய அமைச்சினால் நிதி உதவியாளருக்கு கொடுத்து கிடைக்கப்பட்ட பற்றுச்சீட்டை முன் வைத்து ஆரம்ப விலை விண்ணப்பமும் அதற்குறிய பத்திரங்கள் பெற முடியும். அதற்கு எமது E.mail முகவரியான " www.ncp.gol.lk " க்கு வந்து அதிலுள்ள விண்ணபத்தை ஏற்றுக் கொள்ளப்படுவீர்களானால் செயலாளர், விவசாய அமைச்சு, வட மத்திய மாகாணம் என்ற பெயரில் எழுததப்பட்ட ரூ. 1000/- காசுக் கட்டளை விண்ணப்பத்துடன் முன்வைக்கப்பட வேண்டியதுடன், அவ்வாறு முன்வைக்கப்படாத விண்ணப்பங்கள் நிராகரிக்கப்படும்.

03. சீல் வைக்கப்பட்ட ஆரம்ப விலை விண்ணப்பங்கள் 2011.07.27ம் திகதி பி.ப. 3.30க்கு முதல் கிடைக்குமாறு "செயலாளர், விவசாய அமைச்சு, வட மத்திய மாகாணம்" எனும் முகவரிக்கு பதிவு தபாலில் அனுப்புவதற்கு அல்லது இந்த அமைச்சு கார்யாலயத்தில் வைக்கப்பட்ட டென்டர் பெட்டியில் கையில் கொண்டு வந்து ஒப்படைக்க முடியும்.

04. இது சம்பந்தமான மேலதிய விபரம் பெறுவதற்கு தேவைப்படின் தொலைப்பேசி இல: 025 - 2226831 ஊடாக இந்த அமைச்சின் உப செயலாளர் ( திட்டம் ) ஊடாக விசாரித்து பெற முடியும்.

ஆர்.கே. ப்ரேமசிரி,<br>
செயலாளர்/ டென்டர் கமிடியின் தலைவர்,<br>
விவசாயம், விவசாய உற்பத்தி விற்பனை, கால்நடை உற்பத்தி சுகாதாரம்,<br>
மகளிர் விடயமும் மாகாண நடவடிக்கைகள் அமைச்சு,<br>
வட மத்திய மாகாண சபை.<br>
2011.07.12

## Invitation for Bids

# Ministry of Agriculture, Agro Products Marketing, Animal Production and Health, Women's Affairs and Provincial Council Affairs

# North Central Province

## Procurement of chicks for " the Programme of Backyard Poultry Management " funded by Farmer Trust Fund.

The Chairman of the procurement committee of the Ministry of Agriculture of North Central Province invites bids from eligible suppliers to purchase of suitable chicks for backyard poultry management.

1. 20,000 chicks, suitable for backyard poultry management, should be supplied beginning 04th August 2011, and ending 20th October 2011. (condition and specification relevance to procurement is attached in the annexture (1) contained with application)
2. Bidding documents and application can be obtained by paying a non refundable fee of Rs. 1000.00 to the Financial Assistant of the Ministry of Provincial Agriculture on 8.30 a, m to 3.00 p. m from 12.07.2011 until 26.07.2011. The bid documents can also be downloaded from the official website of the North Central Provincial Council, www.ncp.gov.lk The downloaded documents must be accompanied with a Money order drawn in favour of the Ministry of Agriculture, North Central Province. The downloaded applications without the money order will be rejected at the time of opening bid.
3. Sealed bids application should be sent by registered post to reach " Secretary, Ministry of Agriculture, North Central Province " or can be deposited in the tender box, kept in the office of the Ministry, before 3.30 p.m on 27.07.2011.
4. For Further details, Please contact Assistant Secretary (Planning) of the Ministry through **T. P 025 2226831.**

**R. K. Premasiri**
Chairman,
Ministry Procurement Committee,
Ministry of Agriculture, Agro Products Marketing, Animal Production and Health,
Women's Affairs and Provincial Council Affairs,
North Central Province
2011.07.12

**(I)**

**කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, වනිතා කටයුතු සහ පළාත් සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය මගින් ගොවි භාරකාර අරමුදල යටතේ ක්‍රියාත්මක නිදැලි කුකුළු පාලනය හා බිත්තර නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා නිදැලි කිකිළි පැටවුන් මිලදී ගැනීම.**

## <u>මිල ගණන් පත්‍රය</u>

01. ලංසුකරුගේ / ආයතනයේ නම :- ..........................................................................................

02. ආයතනයේ ලිපිනය :- ..........................................................................................

03. I. දුරකථන අංකය :- ..............................................

II. ෆැක්ස් අංකය :- ..............................................

04. සමාගම් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි වූ සහතිකයේ / ව්‍යාපාර නම, ලියාපදිංචි සහතිකයේ අංකය හා දිනය :- ........................................
(අදාල සහතිකයේ පිටපතක් අමුණන්න.)

05. අදාල කාර්යය සඳහා පළපුරුද්ද :- ..........................................................................................

..........................................................................................................................

..........................................................................................................................

(සනාථ කළ හැකි සහතිකවල පිටපත් අමුණන්න.)

06. ඉදිරිපත් කර ඇති ඇපකර විස්තර :-

| බැංකුවේ නම | ඇපකර අංකය හා නිකුත් කළ දිනය | බැංකු කාල සීමාව | මුදල |
|---|---|---|---|
| | | | |

07. ඉදිරිපත් කරන ලංසු මිල :-

| කිකිළි පැටවුන් වර්ගය | අවශ්‍ය සංඛ්‍යාව | **2011.08.04** දින සිට **2011.10.20** දිනට සැපයිය හැකි පැටවුන් සංඛ්‍යාව (ඇමුණුම -1 බලන්න) | එක් පැටවකු සඳහා අයකරන මිල (රු.) |
|---|---|---|---|
| නිදැලි කිකිළි පැටවුන් | 20000 | | |

මුළු ගණන අකුරින් ලියන්න :- ..................................................................

08. වැට්බදු අංකය :- ..................................................
(TIN සහතිකයේ පිටපතක් අමුණන්න.)

09. ඉදිරිපත් කර ඇති කොන්දේසිවලට යටත්ව උපලේඛනය 01 හි සඳහන් දින හා මා විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් වලට අනුකූලව අදාල නිදැලි කිකිළි පැටවුන් සැපයිය හැකි බවට එකඟ වෙමි.

ලංසුකරුගේ අත්සන :- ........................................................
ආයතනයේ නම හා මුද්‍රාව :- ........................................................
දිනය :- ........................................................

**(II)**

(මෙය ලංසුකරු විසින් සම්පූර්ණ කොට ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුය.)

## <u>සාමාන්‍ය තොරතුරු පත්‍රිකාව</u>

01. ව්‍යාපාරය හිමිකරුගේ නම :-
    ස්ථිර ලිපිනය :-
    දුරකථන අංකය / ෆැක්ස් අංකය :-

02. ව්‍යාපාරයේ නම :-
    ස්ථිර ලිපිනය :-
    දුරකථන අංකය / ෆැක්ස් අංකය :-

03. විගණකගේ නම :-
    ලිපිනය :-
    දුරකථනය අංකය / ෆැක්ස් අංකය :-

04. හවුල් ව්‍යාපාරයක් නම් හවුල්කරුවන්ගේ නම් සහ ලිපිනයන් :-
    1.
    2.
    3.

05. පොදු සමාගමක් නම් වත්මන් අධ්‍යක්ෂවරයාගේ නම් සහ ලිපිනයන් :-

06. පුද්ගලික සමාගමක් නම් එහි කොටස්කරුවන්ගේ නම් සහ ලිපිනයන් :-

07. ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ අංකය හා දිනය :-

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

දිනය :- .....................................

...........................................

ලංසුකරුගේ අත්සන

ලංසුකරුගේ නම :-

# කාර්ය සාධන සුරක්ෂණය (ඇපකරය) සඳහා පිළිගත් ආකෘතිය

...................................................................... *(නිකුත් කරන නියෝජ්‍යායතනයේ නම)* .......................

...................................................................... *(නිකුත් කරන ශාඛාවේ / කාර්යාලයේ ලිපිනය)*

ප්‍රතිලාභියා : ........................................................................... (සේව්‍යයාගේ නම සහ ලිපිනය)

දිනය : ..............................................

කාර්ය සාධන සුරක්ෂණයේ අංකය : ..........................................

(මෙහි මින් මතුවට කොන්ත්‍රාත්කරු වශයෙන් හඳුන්වනු ලබන ...................................................................... (කොන්ත්‍රාත්කරුගේ / සැපයුම්කරුගේ නම ) අංක ..................................... (අංකය යොදන්න) දරණ ................ දිනැති කොන්ත්‍රාත්තුවේ ............................................................................... (ඉදි කිරීම් / සැපයුම සඳහන් කරන්න) සඳහා (මෙහි මින් මතුවට " කොන්ත්‍රාත්තුව " ................................................ යනුවෙන් හඳුන්වනු ලබන) ....................................................................................... (කොන්ත්‍රාත්තුවේ නම සහ වැඩ ගැන කෙටි විස්තරයක් සඳහන් කරන්න) ඔබ ඇතුලත් වූ බව අපට දැනුම් දී ඇත.

තවදුරටත්, කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවලට අනුකූලව කාර්ය සාධන සුරක්ෂණයක් අවශ්‍ය බව අපි දනිමු.

කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම පරිදි අපි ............................................................................ (නිකුත් කරන නියෝජ්‍යායතනයේ නම ) කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අනුකූලව කොන්ත්‍රාත්කරු බැඳීම් උල්ලංඝනය කර ඇති බවට ඔබ වෙත ලැබෙන ලිඛිත ප්‍රකාශය සහිත ප්‍රථම ලිඛිත ඉල්ලීම අප වෙත ලැබුණු පසු ඔබගේ ඉල්ලීම සනාථ කිරීමට කරුණු ඉදිරිපත් කිරීමේ හෝ ඔබගේ ඉල්ලීමට හේතු සාධක දැක්වීමට හෝ එහි නිර්දිෂ්ය මුදල සනාථ කිරීමට හෝ සඳහා අවශ්‍යතාවයෙන් තොරව එහි සඳහන් ......................................................... (මුදල ඉලක්කමෙන්) / (මුදලඅකුරෙන් සඳහන් කරන්න) නොඉක්මවන ඕනෑම මුදල් ප්‍රමාණයක් හෝ ප්‍රමාණයන් අහෝසි කර ඔබට ගෙවීමට අපි භාර ගතිමු. එම මුදල කොන්ත්‍රාත් මුදල ගෙවිය යුතු මුදල් වර්ගයකින් සහ එම ව්‍යවහාරික මුදල් වල පරිවර්තිත වට්නාකමින් විය යුතුය.

මෙම සුරක්ෂණය අවම වශයෙන් ................................... දිනට අවසන් වනු ඇති අතර, (කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමට නියමිත දිනෙන් ඔබ්බට දින 28 ක් සඳහන් කරන්න) ගෙවීම් සඳහා කරනු ලබන ඕනෑම ඉල්ලීමක් එදිනට හෝ එදිනට පෙර මෙම කාර්යාලයට ලැබිය යුතුය.

මෙම සුරක්ෂණය (අ) ලංසුකරු  ජයග්‍රාහි ලංසුකරුවේ නම්, ලංසුකරු විසින් අත්සන තබන ලද කොන්ත්‍රාත්තතුවේ  සහ ලංසුකරු විසින් ඔබට නිකුත් කර ඇති කාර්ය සඳහා සුරක්ෂණ පත්‍රෙය්  පිටපත් අප වෙත ලැබීමෙන්  පසු හෝ (අ) ලංසුකරු ජයග්‍රාහී ලංසුකරු නොවන්නේ නම්  (1) ලංසුකරු ජයග්‍රාහී ලංසුකරු නොවන බවට  ලංසුකරුට ඔබ යවන දැන්වීමේ පිටපත අප වෙත ලැබුණු පසු,  එනම් පෙරට යෙදෙන අවස්ථාවේ අවලංගු වනු ඇත.  නැතහොත්  ........................................................... (දිනය සඳහන් කරන්න) දින දක්වා මෙම සුරක්ෂණය බලාත්මකව පවතිනු ඇත.

පසුකාලීනව මෙම සුරක්ෂණය යටතේ ගෙවීම් සඳහා කරනු ලබන ඉල්ලීමක් ................................... දිනට හෝ එදිනට පෙර මෙම කාර්යාලය වෙත ලැබිය යුතුය.

අධිකාරියලත් නියෝජිත / නියෝජිතයින්ගේ අත්සන / අත්සන් :

## (IV)

# ලංසු කරුවන් සඳහා උපදෙස් හා කොන්දේසි පත්‍රිකාව

## 01. ලංසු කැඳවීම

උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙනුවෙන් එහි ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ගොවි භාරකාර අරමුදල යටතේ 2011 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත " නිදැලි කුකුළු පාලනය හා බිත්තර නිෂ්පාදන වැඩසටහන " වෙනුවෙන් නිදැලි කිකිළි පැටවුන් මිලදී ගැනීම සඳහා සුදුසුකම්ලත් යෝග්‍ය සැපයුම්කරුවන් / නිෂ්පාදකයින් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 02. ලංසු ලියවිලි

මෙම ලංසුවට පහත සඳහන් ලියවිලි ඇතුලත් වේ.

I. ලංසුකරුවන් සඳහා උපදෙස් හා කොන්දේසි පත්‍රිකාව
II. මිල ගණන් පත්‍රය හා සැපයිය යුතු ස්ථාන පිළිබඳ සටහන් ලේඛන (ඇමුණුම - 1)
III. පැටවුන් සඳහා අදාල ප්‍රමිතීන් හා පිරිවිතර
IV. සාමාන්‍ය තොරතුරු පත්‍රිකාව
V. කාර්ය සාධන ඇපකරය

03. ලංසුපත් ලබා ගැනීමට අදහස් කරන ලංසුකරුවන් ආපසු නොගෙවන රු. 1000/- ක ගාස්තුවක් හා ආපසු ගෙවන රු. 62500/- ක ගාස්තුවක් කෘෂිකර්ම අමාත්‍යාංශයේ මුදල් සහකාර වෙත ඉදිරිපත් කර අදාල ලංසු ලියවිලි සහ පිරිවිතර ලබාගත යුතු වේ. එමෙන්ම "www.ncp.gov.lk" වෙබ් අඩවිය වෙත පිවිස එහි ඇති අයදුම්පත බාගත කරගන්නේ නම් ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය, උතුරු මැද පළාත නමින් ලියන ලද රු. 63500/- ක මුදල් ඇණවුමක් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැති අයදුම්පත් කොන්දේසි විරහිතව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ලංසු අයදුම්පත්‍ර හා අදාල ලියවිලි 2011.07.12 දින සිට 2011.07.26 දින ප. ව 3.00 දක්වා නිකුත් කරනු ලැබේ. 2011.07.27 දින ප. ව 3.30 ට ලංසු භාර ගැනීම අවසන් වන අතර ලංසු භාර ගැනීම අවසන් වු වහාම පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ නිල කාමරයේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු කරුවන් හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයෙකුට මෙම අවස්ථාව සඳහා සහභාගී විය හැකිය.

05. අදාල ලංසු අයදුම්පත්‍ර පිටපත් දෙකකින් ඉදිරිපත් කළයුතු අතර " මුල් පිටපත " හා "අනු පිටපත" ලෙස පැහැදිලිව සඳහන් කර වෙන වෙනම කවරවල බහා මුද්‍රා තබා එම කවර දෙක තනි එක් කවරයක බහා 2011.07.27 දින ප. ව 3.30 ට පෙර ලැබෙන සේ ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය, උතුරු මැද පළාත, මහ ලේකම් ගොඩනැගිල්ල, අනුරාධපුර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ මෙම අමාත්‍යාංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලිය යුතුය.

06. මිල ගණන් එවීමේදී මිල ගණන් බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ " නිදැලි කුකුළු පාලනයට සුදුසු කිකිළි පැටවුන් සඳහා මිල ගණන් - 2011 " යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

07. **2011.08.04 දින සිට <u>2012.01.20</u>** දින දක්වා වලංගු වන සේ රු. 62500.00 ක වාණිජ බැංකුවකින් ලබා ගන්නා ලද ලංසු සුරක්ෂණයක් (Bid bond) අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.

08. ලංසු ඉදිරිපත් කිරිමේදී පහත සඳහන් ලියවිලි එවීම අනිවාර්ය වේ.

I. මිල ගණන් පත්‍රය (මුල් පිටපත හා අනු පිටපත)
II. ලංසු සුරක්ෂණය (Bid bond)
III. ලංසුකරු විසින් අත්සන් තබන ලද කොන්දේසි පත්‍රිකාව.

09. මෙම ලංසුව විවෘත කළ දින සිට දින 60 ක කාලයක් ලංසු කරුවන් විසින් තමන්ගේ කොන්දේසි රහිත මිල ගණන් විවෘතව තැබිය යුතුය.

10. මිල ගණන් පත්‍රය.

I. ලංසු ලියවිලිවලට ඇතුලත් වන මිල ගණන් පත්‍රය නිසි පරිදි සම්පුර්ණ කොට අත්සන් තබා ඉදිරිපත් කළ යුතු වේ.

II. මිල ගණන් පත්‍රෙයහි මිල ගණන් වෙනස් කර ඇත්නම්, ඒ බව ලංසුකරු විසින් කෙටි අත්සන යොදා සහතික කළ යුතු වේ.

III. මිල ගණන් ඉදිරිපත් කිරීමේදී ලංසුකරු විසින් කොන්දේසි රහිත මිල ගණන් ඉදිරිපත් කළ යුතු වේ. කොන්දේසි සහිත මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

IV. නිසි පරිදි සම්පුර්ණ නොකර, අත්සන් නොකර ඉදිරිපත් කර ඇති මිල ගණන් ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

V. ලංසුකරු විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් ලංසුවේ වලංගු කාලය අවසන් වන තෙක් නොවෙනස්ව පැවතිය යුතු අතර, කවර හේතුවක් නිසාවත් එය වෙනස් නොවිය යුතුය.

VI. වැට් බද්ද ඉල්ලුම් කරන්නේ නම් වැට් බදු අංකය ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුය.

11. 2011 .08.04 දින වනවිට ඔබගේ ආයතනයට මෙම අමාත්‍යාංශය වෙත සැපයිය හැකි කිකිළි පැටවුන් සංඛ්‍යාව සූදානම්ව තිබිය යුතු අතර 2011 .10.20 දින වන විට අදාල මුළු පැටවුන් ප්‍රමාණය සපයා අවසන් කළ යුතුය.

12. තාක්ෂණ කමිටුවක් මගින් නිදැලි කිකිළි පැටවුන් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිදැලි කිකිළි පැටවුන් සැපයීම සඳහා සුදුසු ආයතන තෝරා ගනු ලැබේ. පැටවුන් මිලට ගනු ලබන අවස්ථාවේ දී ද තාක්ෂණ කමිටුව විසින් අදාල පැටවුන් පරීක්ෂා කර බලනු ඇත.

13. තෝරා ගනු ලබන සැපයුම් කරුවන් විසින් ඇමුණුම 1 හි සඳහන් ස්ථාන කරා ඉපදී සති 6 වයසැති ලිංග නිර්ණය සිදු කරන ලද කිකිළි පැටවුන් ප්‍රවාහනය කළ යුතු වේ. අදාල කිකිළි පැටවුන් මෙහි සඳහන් පිරිවිතරවලට අනුව නිෂ්පාදනය කර තිබිය යුතුය.

14. තෝරාගත් සෑම සැපයුම්කරුවෙක්ම ඇණවුම ලද වටිනාකම අනුව වාණිජ බංකුවකින් ලබාගත් 10% ක මුදලකට සමාන කාර්ය සාධන ඇපකරයක් සැපයුම අවසන් කළ දින සිට මාස තුනකට වලංගු වන පරිදි (අවම වශයෙන් දින 300 ක්) පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. එසේම පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ ගිවිසුමකට ද එළඹිය යුතුය.

15. අදාල කිකිළි පැටවුන් සැපයීමෙන් මාස තුනකට පසු කාර්ය සාධන ඇපකරය නිදහස් කිරිමට කටයුතු කරනු ලැබේ.

16. ගිවිසුම් කාලය තුල ගිවිස ගන්නා ලද කිකිළි පැටවුන් සැපයීමට සැපයුම්කරු කටයුතු කළයුතු අතර පිළිගත හැකි හේතු ඉදිරිපත් කර, කිකිළි පැටවුන් ඇණවුම් කරන නිලධාරියාගේ පූර්ව අනුමැතිය නොමැතිව ගිවිසුම්ගත කාලය තුල සැපයුම් කිරිමට සැපයුම්කරු අපොහොසත් වුවහොත් එසේ සැපයීම ප්‍රමාද වන එක් දිනයක් සඳහා දිනකට මුළු ලංසු වටිනාකමින් 0.5% ක දඩ මුදලක් ප්‍රමාද ගස්තු වශයෙන් අයකරනු ලැබේ.

17. වලංගු කාලය ඉක්ම යාමට පෙර සැපයුම් අවසන් කිරීමට අපොහොසත් වන සැපයුම්කරුවන් අසාර්ථක සැපයුම් කරුවන් ලෙස සලකා අසාදු ලේඛන ගත කිරිමට කටයුතු කරනු ලබන අතර, මින් ඉදිරියට උතුරු මැද පළාත් සභාවේ සැපයුම් කොන්ත්‍රාත් පිරිනැමීමද වලක්වාලීමට කටයුතු කරනු ලැබේ.

18. ප්‍රසම්පාදනය පිළිගත් බවට වන දැන්වීම ලංසු ආකෘතියේ සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ෆැක්ස් මගින් යවන ලද්දේ නම් හෝ එම ලිපිනයේ සඳහන් ස්ථානයේ තබන ලද්දේ නම් හෝ එය සැපයුම්කරුට ලැබුණා සේ සැලකේ.

19. ඉහත කොන්දේසි හා නියමයන්ටත්, පළාත් කෘෂිකර්ම ලේකම් විසින් වරින්වර පැනවිය හැකි ව්‍යාතිරේඛ නියමයන්ටත් එකඟව ලංසු ඉදිරිපත් කළ යුතු අතර, එසේ ඉදිරිපත් නොවන අඩුපාඩු සහිතව කිසියම් ලංසුවක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරිම හා ප්‍රමාණය අඩු වැඩි කිරීමේ සම්පූර්ණ අයිතිය ද ප්‍රසම්පාදන කමිටුව සතු වන බව කරුණාවෙන් සලකන්න.

20. තව ද ඔබ 1995 අංක 11 දරණ බේරුම් කිරීමේ පණතට එකඟව කටයුතු කරන බවට ද එකඟ විය යුතු වේ.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය,
උතුරු මැද පළාත.

නිදැලි කිකිළි පැටවුන් මිලදී ගැනීම වෙනුවෙන් වූ මෙම ප්‍රසම්පාදනය සඳහා මෙහි පහත අත්සන් කරන ........................................................................................................................ යන ලිපිනයේ ස්ථාපිත ..................................................................................................... වන මම / අපි මෙම ප්‍රසම්පාදනය සම්බන්ධව නිකුත් කර ඇති සියලුම කොන්දේසි, උපදෙස්, පිරිවිතර සහ උප ලේඛණ කියවා තේරුම් ගෙන මිල ගණන් පත්‍රයෙහි අංක 07 යටතේ දක්වා ඇති මිල ගණන් යටතේ මුළු වටිනාකම රු. ......................................................................... (අකුරෙන්) වූ නිදැලි කිකිළි පැටවුන් ප්‍රමාණය සියලු පිරිවිතර වලට අනුකූලව සැපයීමට එකඟ වන බවත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව මිස ලංසුව ඉල්ලා අස්කර නොගන්නා බවත්, 1995 අංක 11 දරණ බේරුම් කිරීමේ පණතට අනුව කටයුතු කිරීමට එකඟ වන බවත්, මෙම ප්‍රසම්පාදනය සම්බන්ධව අමාත්‍යාංශ ප්‍රසම්පාදන මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වන බවත්, එම තිරණයන් පිළිබඳව හේතු දැක්වීම අවශ්‍ය නොවන බවත්, තේරුම් ගෙන මෙම ප්‍රසම්පාදනය ඉදිරිපත් කරන බවත් ප්‍රකාශ කර පහත අත්සන් කරමි / කරමු.

**ලංසුකරුගේ අත්සන :**

ලංසුකරුගේ නම :

ජාතික හැඳුනුම්පත් අංකය :

ලිපිනය :

දිනය :

**1 වන සාක්ෂිකරු**

නම :

ජාතික හැඳුනුම්පත් අංකය :

ලිපිනය :

දිනය :

**2 වන සාක්ෂිකරු**

නම :

ජාතික හැඳුනුම්පත් අංකය :

ලිපිනය :

දිනය :

# <u>නිදැලි කුකුළු පාලන වැඩසටහන සඳහා කිකිළි පැටවුන් මිලට ගැනීමේදී තිබිය යුතු ප්‍රමිතීන් හා පිරිවිතර</u>

**01.** වයස - සති 06 ක් වු ජීව බර අවම වශයෙන් ග්‍රෑම් 350 – 400 ක් වු නිරෝගී කිකිළි පැටවුන් විය යුතුය. නියමිත අවම බර ප්‍රමාණය නොතිබුන හොත් එම සතුන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**02.** ප්‍රතිශක්තිකරණ එන්නත් කිරීම් - සති 6 ක් දක්වා වන සියලුම එන්නත් ලබා දී තිබිය යුතුය.

<u>නිර්දේශිත එන්නත් වැඩපිළිවෙල :</u>

- වයස සති 1 දී - ගම්බෝරෝ එන්නත
- වයස සති 2 දී - රනිකට් එන්නත් සඳහා Hitchner B I Strain එන්නත
- වයස සති 3 දී - ගම්බෝරෝ එන්නත
- වයස සති 4 දී - වසූරිය සඳහා එන්නත
- සති 5 – 6 දී - රනිකට් II එන්නත Killed Vaccine (Oil Adjuvant) එන්නත විය යුතුය.

ඉහත එන්නත් ලබාදුන් බවට අදාල පශු වෛද්‍ය නිලධාරි සහතිකය මගින් සනාථ කළයුතු වේ.

**03.** කිකිළි පැටවුන් පමණක් විය යුතු අතර උපරිම පිරිමි පැටවුන් ප්‍රතිශතය 3% නොඉක්මවිය යුතුය.

ඇමුණුම (1)

## කෘෂි සංවර්ධන සමුපකාර සමිති මගින් නිදැලි කිකිළි පැටවුන් බෙදා දීමේ වැඩසටහන - 2011

### කෘෂිකර්ම අමාත්‍යාංශය - උතුරු මැද පළාත

| අනු අංකය | ප්‍රාදේශීය කෘෂි සංවර්ධන සමුපකාර සමිතිය | ගම් කුකුළු පැටවුන් ගෙනවිත් භාරදිය යුතු ස්ථානය | සංවර්ධන / වැඩසටහන් සහකාරගේ නම | ජංගම දුරකථන අංකය | භාරදිය යුතු දිනය | ගෙනවිත් භාරදිය යුතු පැටවුන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1 | නොච්චියාගම | පශු වෛද්‍ය නිලධාරි කාර්යාලය, නොච්චියාගම | එස්. සී. සමරසිංහ මයා | 071-8101495 | 2011.08.04 | 1600 |
| 2 | පලුගස්වැව | පශු වෛද්‍ය නිලධාරි කාර්යාලය, පලුගස්වැව | ආර්. එම්. ආර්. එස්. රස්නායක මයා | 071-8272183<br>072-6160602 | 2011.08.11 | 1600 |
| 3 | වැලිකන්ද | පශු වෛද්‍ය නිලධාරි කාර්යාලය, වැලිකන්ද | ආර්. ප්‍රියන්ති පතිරගේ මිය | 071-6425301 | 2011.08.18 | 1600 |
| 4 | මහවිලච්චිය | පශු වෛද්‍ය නිලධාරි කාර්යාලය, මහවිලච්චිය | පී. එම්. අතුල බණ්ඩාර මයා | 071-7087331 | 2011.08.25 | 1600 |
| 5 | ඉපලෝගම | පශු වෛද්‍ය නිලධාරි කාර්යාලය, ඉපලෝගම | එම්. බී. දිසානායක මයා | 071-8046976 | 2011.09.01 | 1600 |
| 6 | මැදවච්චිය | පශු වෛද්‍ය නිලධාරි කාර්යාලය, මැදවච්චිය | ආර්. එම්. ආර්. එස්. රස්නායක මයා | 071-8272183<br>072-6160602 | 2011.09.08 | 1600 |
| 7 | පදවිය | පශු වෛද්‍ය නිලධාරි කාර්යාලය, පදවිය | ආර්. නලීන් තුසිත කුමාර මයා | 071-8140514 | 2011.09.15 | 1600 |
| 8 | රඹෑව | පශු වෛද්‍ය නිලධාරි කාර්යාලය, රඹෑව | ආර්. නලීන් තුසිත කුමාර මයා | 071-8140514 | 2011.09.22 | 1600 |
| 9 | කැබිතිගොල්ලෑව | පශු වෛද්‍ය නිලධාරි කාර්යාලය, කැබිතිගොල්ලෑව | පී. එම්. අතුල බණ්ඩාර මයා | 071-7087331 | 2011.09.29 | 1600 |
| 10 | ගලෙන්බිඳුණුවැව | පශු වෛද්‍ය නිලධාරි කාර්යාලය, ගලෙන්බිඳුණුවැව | ශාන්ත අමරතුංග මයා | 071-1473338 | 2011.10.06 | 1600 |
| 11 | කහටගස්දිගිලිය | පශු වෛද්‍ය නිලධාරි කාර්යාලය, කහටගස්දිගිලිය | සුසන්ත රාජපක්ෂ මයා | 071-8047069 | 2011.10.13 | 1600 |
| 12 | හොරොව්පොතාන | පශු වෛද්‍ය නිලධාරි කාර්යාලය, හොරොව්පොතාන | චන්දන කුමාර රත්නසේකර මයා | 071-2378945 | 2011.10.20 | 400 |